සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

6 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 34 S

**විද්‍යාව** | කාලය පැය දෙකයි

උපදෙස් :
- I කොටස - ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේම සළකුණු කරන්න.
- සියලුම ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර තෝරන්න.

01. පහත පිළිතුර අතරින් අජීවී ද්‍රව්‍ය <u>පමණක්</u> ඇති පිළිතුර තෝරන්න.
1. ළමයා, පොල් ගස, ගඩොල　　2. ගඩොල, පැන, මකනය
3. ජලය, බයිසිකලය, ගිරවා　　4. පොල්ගස, අඹ ගස, මැ වැල

02. රෙදි සේදීමේදී ඉතා හොඳින් කුණු ඉවත් කරගත හැක්කේ පහත කුමන ජලය භාවිතයෙන් ද?
1. ළිං ජලය　　2. ගංගා ජලය　　3. මුහුදු ජලය　　4. වර්ෂා ජලය

03. ක්ෂුද්‍ර ජීවීන් හොඳින් නිරීක්ෂණය කළහැකි අවස්ථාව තෝරන්න.
1. එළිමහන් ස්ථානයක ජලය පියවි ඇසින් නිරීක්ෂණය කිරීම.
2. අත් කාචයක් තුළින් පල්වූ ජලය නිරීක්ෂණය කිරීම.
3. කොම්පෝස්ට් පොහොර දියකර ලබාගත් ජලය කාචයකින් නිරීක්ෂණය කිරීම.
4. පල්වූ ජලය අන්වීක්ෂයකින් නිරීක්ෂණය කිරීම.

04. අත් කාචයකින් එකවරකදී වැඩිම ජීවීන් සංඛ්‍යාවක් නිරීක්ෂණය කිරීමට හැකිවන්නේ,
1. පළගැටියන්　　2. හැකරැල්ලන්　　3. වේයන්　　4. ගොළුබෙල්ලන්


05. පිළිවෙලින් ශාක, සතුන් හා ක්ෂුද්‍ර ජීවීන් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. කෙසෙල්, කුරුමිණියා, වේයා　　2. නෙළුම්, ඉස්ගෙඩියා, බැක්ටීරියා
3. වේයා, බැක්ටීරියා, කෙසෙල්　　4. කෙසෙල්, ඉස්ගෙඩියා, වේයා

06. සංචරණයක් හෝ චලනයක් දක්නට <u>නොලැබෙන්නේ,</u>
1. මුහුදු මල　　2. නිදිකුම්බා　　3. ගැඩවිලා　　4. බයිසිකලය

07. යම් ජීවියෙකු ස්වයංපෝෂී ලෙස හැඳින්වීමට එම ජීවියා සතුවිය යුතු ප්‍රධානතම ලක්ෂණය වන්නේ,
1. ඔවුන් ස්වසනය කිරීමයි.　　2. වර්ධනය වීමයි.
3. ප්‍රභාසංස්ලේෂණය කිරීමයි.　　4. සංචරණය කිරීමයි.

08. සතුන් , ශාක භක්ෂක සහ මාංශ භක්ෂක ලෙස වර්ග කිරීමේදී පදනම් කරගන්නේ,
1. භෝජන ක්‍රමයයි.　　2. භෝජන විලාසයයි.　　3. සංචරණ ක්‍රමයයි.　　4. ජීවත් වන පරිසරයයි.

09. පහත රූපයේ දැක්වෙන ජීවීන් සතු ලක්ෂණය වන්නේ,



1. වර්ධනයයි.　　2. ප්‍රජනනයයි.　　3. පෝෂණයයි.　　4. ස්වසනයයි.


10. භූගත ජලය පවතින ආකාරයකි,
1. සාගර ජලය　　2. ගංගා ජලය　　3. උල්පත් ජලය　　4. පොකුණු ජලය

11. අවශ්‍ය පමණට ජලය පානය නොකරන අයකු මුහුණ පාන ගැටළුවක් වන්නේ,
1. මලබද්ධය ඇතිවීමයි　　2. අධික රුධිර පීඩනය ඇතිවීමයි　　3. දියවැඩියාව සෑදීමයි　　4. සෙම්ප්‍රතිශ්‍යාව වැළඳීමයි



LIVEWORKSHEETS

12. ශිෂ්‍යයෙකු කරන ලද ක්‍රියාකාරකමක රූප සටහනක් පහත දැක්වේ.





මෙහිදී ලැබෙන නිරීක්ෂණය සහ නිගමනය දැක්වෙන පිළිතුර තෝරන්න.

| නිරීක්ෂණය | නිගමනය |
| --- | --- |
| 1. අවර්ණ හුණු දියරයේ වර්ණය වෙනස් නොවේ. | ස්වසනයේ දී ඔක්සිජන් පිටවේ. |
| 2. අවර්ණ හුණු දියරය කිරි පැහැයට හැරේ. | ස්වසනයේ දී ඔක්සිජන් පිටවේ. |
| 3. අවර්ණ හුණු දියර කිරි පැහැයට හැරේ. | ස්වසනයේ දී කාබන් ඩයොක්සයිඩ් වායුව පිටවේ. |
| 4. අවර්ණ හුණු දියරයේ වර්ණය වෙනස් නොවේ. | ස්වසනයේ දී කාබන් ඩයොක්සයිඩ් වායුව පිටවේ. |

13. පදාර්ථ සහ ශක්ති පිළිබඳව ප්‍රකාශ හතරක් පහත දැක්වේ. ඒවා අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. වාතයට ස්කන්ධයක් නැත. එබැවින් වාතය ශක්තියකි.
2. ආලෝකය අවකාශයේ ඉඩක් නොගන්නා අතර ස්කන්ධයක්ද නැති නිසා ආලෝකය ශක්තියකි.
3. ධ්වනිය ශක්තියක් වන අතර එය අවකාශයේ ඉඩක් ගනී.
4. ගඩොලක් අවකාශයේ ඉඩක් නොගන්නා අතර ස්කන්ධය සහිතය. එබැවින් පදාර්ථයකි.

- **14 සහ 15 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත රූප සටහන උපයෝගි කරගන්න.**





14. ඉහත ක්‍රියාකාරකමේ දී ලැබෙන නිරීක්ෂණ අනුපිළිවෙලින් සඳහන් පිළිතුරු තෝරන්න.
1. අයිස් → ජලවාෂ්ප → ජලය 2. ජලය → අයිස් → ජලවාෂ්ප
3. ජලවාෂ්ප → ජලය → අයිස් 4. අයිස් → ජලය → ජලවාෂ්ප

15. ඉහත අවස්ථා විපර්යාසය සිදුවන්නේ ඉටිපන්දම් දැල්ලෙන් ලැබෙන,
1. තාපය නිසා ය. 2. උෂ්ණත්වය නිසා ය.
3. ආලෝකය නිසා ය. 4. ස්පර්ශය නිසා ය.

16. වැසි දිනවලදී වාහනවල වැසූ වීදුරුවක ඇතුළු පැත්තෙහි ජලය පටලයක් තැන්පත් වන බව නිරීක්ෂණය විය. මෙයට හේතුව වන්නේ,
1. වාහනය තුළ වාතයේ ජලවාෂ්ප පැවතීමයි. 2. වර්ෂා ජලය වීදුරු හරහා කාන්දුවීමයි.
3. වාහන වීදුරු මත දූවිලි තැන්පත්වී තිබීමයි. 4. වාහනය තුළින් වාතය පිටතට ගමන් නොකිරීමයි.


17. ශාකවල සහ සතුන්ගේ ස්වසනය පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක්ද?
1. සතුන් ස්වසනය කරන අතර ශාක ස්වසනය නොකරයි.
2. ස්වසනය යනු ආශ්වාස කිරීම සහ ප්‍රශ්වාස කිරීමයි.
3. ශාක මෙන්ම සතුන්ද ස්වසනයේ දී චලන දක්වයි.
4. ශාක මෙන්ම සතුන්ද ස්වසනයෙන් ශක්තිය නිපදවාගනී.

18. සමාන ජල පරිමා විවිධ හැඩයේ භාජන හතරකට දමා ඇති අයුරු පහත දැක්වේ.



මෙම ක්‍රියාකාරකමෙන් වඩාත් හොඳින් පෙන්වා දියහැක්කේ,
1. ජලයට නිශ්චිත හැඩයක් ඇති බවයි.
2. ජලය ඕනෑම භාජනයකට දැමිය හැකි බවයි.
3. ජලය අඩංගු භාජනයේ හැඩය ගන්නා බවයි.
4. ජලය ද්‍රව අවස්ථාවේ පවත්නා බවයි.

19. වාතයෙහි ලක්ෂණ හඳුනා ගැනීමට සිදු කරන ලද ක්‍රියාකාරකමක රූපයක් මෙහි දැක්වේ.
මෙයින් ලබා ගතහැකි නිගමනයක් වන්නේ,
1. පරීක්ෂා නළය තුළ වාතය ඇති බවයි.
2. පරීක්ෂා නළයට ජලය ඇතුළු නොවන බවයි.
3. නළය ජලය තුළට තල්ලුකිරීම අපහසු බවයි.
4. වාතය අවකාශයේ ඉඩක් ගන්නා බවයි.




20. සිසිල් ජල භාජනයකට එක්වරම අයිස් කැටයක් වැටීමට සැලැස්වූ විට ක්ෂණිකවම නිරීක්ෂණය වන්නේ,
1. එකවරම ජලයේ උෂ්ණත්වය පහළ යාම. 2. අයිස් කැටය ජලය යටට ගොස් මතුපිටට පැමිණ පාවීම.
3. භාජනයේ ජලය වාෂ්ප වීමට පටන් ගැනීම. 4. භාජනය සහ ජලය වේගයෙන් සිසිල්වීම.



LIVEWORKSHEETS